# ගරු අගමැතිතුමාගේ පණිවුඩය



විද්‍යාත්මක නව සොයා ගැනීම් ප්‍රායෝගික කෘෂිකර්මය සඳහා යොදවා ගැනීමේදී මුහුණ පාන්නට සිදුවන බලගතුම ප්‍රශ්නය නම් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයා හා ගොවියා අතර ඇති අධ්‍යාපන පරතරය මකාලීමේ ප්‍රශ්නයයි. නව ශිල්පී ක්‍රමයන් පිළිබඳ දැනීම බෙදා හැරිය හැක්කේ උපදේශකයා හා ගොවියා අතර හොඳ අවබෝධයක් ඇති වුව හොත් පමණි. ඒ එසේ වතුදු මෙතෙක් මුදුන් පමුණුවාගෙන ඇති කාර්මික හා විද්‍යාත්මක දැනුම පිළිබඳ ප්‍රගතියට සරිලන පරිදි ගොවියාගේ අධ්‍යාපනය වර්ධනය වී නොතිබීම අභාග්‍යයකි.

කෘෂිකර්මය පාසල් විෂයයක් වශයෙන් කාල සටහනට අඩංගු කිරීම සඳහා රජය මගින් දැනටමත් විධි විධාන යොදාගෙන යනු ලැබේ. ජාතික ආහාර නිෂ්පාදන ව්‍යාපාරය සඳහා පාසැල් සිසුන්ගේ සහාය හා සහයෝගයද ලබාගෙන ඇත. මෙවැනි විධි විධාන වලට අමතර වශයෙන් ගොවිකම් සඟරාව වැනි ශාස්ත්‍රීය සංග්‍රහයන් මගින් කෘෂිකර්මය හා සත්වපාලනය පිළිබඳ නවතම දැනුම දිවයිනේ පාසැල් සිසුන් හා ගොවි ජනතාව අතර සරල ලිහිල් බසින් පතුරුවා හැරීමේ කාර්යය තව දුරටත් අඛණ්ඩව පවත්වාගෙන යනවා ඇත.

පසුගිය අවුරුදු 60ක, කාලයක් තුළ උසස් තත්ත්වයකින් ගොවිකම් සඟරාව පවත්වාගෙන යෑම ගැන කතෘ මණ්ඩලයට මගේ ප්‍රශංසාව හිමි කරමි. අනාගතයේදීත් මෙම උසස් තත්ත්වය පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කරමි.

අග්‍රාමාත්‍යතුමා